# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 76 දරන
# පොදු දේපළ විෂයෙහිලා
# සිදුකරනු ලබන වැරදි පිළිබඳ
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි. නැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 76 දරන පොදු දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 21/85

**1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 76 දරන පොදු දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

1982 අංක 12 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

“ (3) සොරකම් කරනු ලැබූ දේපළක් බව දැනුවත්ව හෝ සොරකම් කරනු ලැබූ දේපළක් බවට විශ්වාස කිරීමට හේතු ඇති පොදු දේපළක් වූ සොරකම් කරනු ලැබූ යම් දේපළක් වංචනික ලෙස ලබා ගන්නා හෝ තබා ගන්නා යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු එකකට නොඅඩු එහෙත් අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ද රුපියල් එක් දහසක් හෝ ඒ වරද සිදු කරන ලද්දේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි වටිනාකම මෙන් තුන් ගුණයක් හෝ යන දෙකෙන් වැඩි මුදල විය යුතු දඩයකින් ද ඔහුට දඬුවම් ලැබිය යුතු ය. ”.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය 5අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට 5අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

“ නිශ්චිත අක්ෂරයක්, ලකුණක් හෝ සටහනක් දරන දේපළක් පොදු දේපළක් වන බව.

5අ. මේ පනතේ සඳහන් කරනු ලැබ ඇති යම් වරදකට අදාළ වූ යම් නඩු කටයුත්තක දී, වරද සිදු කරනු ලැබ ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එම දේපළෙහි මෙහි උපලේඛනයෙහි දක්වා ඇති යම් අක්ෂරයක්, ලකුණක් හෝ සටහනක් ඇති බවට ඔප්පු කරනු ලැබූ විට, ඊට පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක් එය පොදු දේපළක් ලෙස සලකනු ලැබිය යුතු ය. ”.

2—ඒ098818—7,580 (87/08)

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. "කොල්ලකෑම" යන්නෙහි අර්ථ නිරූපනයට ඉක්බිතිව පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 12 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'"සොරකම් කරනු ලැබූ දේපල" යන්නෙහි දණ්ඩ නීති සංග්‍රහයෙහි ඊට ඇති අර්ථයම ඇත්තේ ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනයක් ඇතුළත් කිරීම.


5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය ඇතුළත් කරනු ලැබේ :—

"උපලේඛනය

(12අ වන වගන්තිය)



හෝ



."